ARTICLE 19

# මහජනයාගේ දැනගැනීමේ අයිතිය: තොරතුරු දැනගැනීමේ අයිතිය හා සබැඳි නීති සම්පාදනයට අදාළ මූලධර්ම

## The Public's Right to Know: Principles on Right to Information Legislation

2015

ARTICLE 19 Asia Programme
Free Word Centre
60 Farringdon Road
London
EC1R 3GA
United Kingdom

T: +44 20 7324 2500
E: info@article19.org
W: www.article19.org
Tw: @article19org
Fb: facebook.com/article19org

ARTICLE 19 Asia Programme
23/24, Yangon Insein Road, 1st floor
9-ward
Hlaing Township
Yangon
Myanmar

T: +95 925 348 1638
E: myanmar@article19.org

Tw: @article19asia

ISBN: 978-1-910793-11-4

© ARTICLE 19, ආර්ටිකල් 19, 2015

This work is provided under the Creative Commons Attribution-Non-Commercial- ShareAlike 2.5 licence. You are free to copy, distribute and display this work and to make derivative works, provided you: 1) give credit to ARTICLE 19; 2) do not use this work for commercial purposes; 3) distribute any works derived from this publication under a licence identical to this one. To access the full legal text of this licence, please visit: http://creativecommons.org/licenses/by-nc-sa/2.5/legalcode.

ARTICLE 19 would appreciate receiving a copy of any materials in which information from this report is used.

The ARTICLE 19 Asia Programme's right to information project has been financed by the Government of Sweden under the Civic Space Initiative. Responsibility for the content lies entirely with the creator. The Government of Sweden does not necessarily share the expressed views and interpretations.

ආර්ටිකල් 19 වෙතින් උපුටාගත් බව සඳහන් කරමින් මෙම ලේඛණයේ අඩංගු කරුණු භාවිතා කළ හැකි පරිදි ක්‍රියේටිව් කොමන්ස් බලපත්‍ර යටතේ මෙම ලියවිල්ල ඉදිරිපත් කරනු ලැබේ. 1) ආර්ටිකල් 19 වෙතින් උපුටාගත් බව කියන්න 2) වාණිජ කටයුතු සඳහා භාවිතා නොකරන්න 3) මෙම ලියවිල්ලෙන් උපුටා ගන්නා දෑ මත පදනම් වන කිසිවක් බෙදා හැරිය යුත්තේ ඉහත බලපත්‍රය යටතේය . එම බලපත්‍රයේ සම්පූර්ණ නීතිමය තත්ත්වය මෙම වෙබ් ලිපිනය ඔස්සේ ලබාගත හැක ; http://creativecommons.org/ licenses/by-nc-sa/2.5/legalcode.

මෙම ලියවිල්ලෙන් උපුටා ගනිමින් සකස් කරනු ලබන ඕනෑම වාර්තාවක පිටපතක් ආර්ටිකල් 19 වෙත එවනු ලබන්නේ නම් ස්තුතිවන්ත වන්නෙමු.

මෙම වාර්තාව සම්පාදනයේදී වැයකරන ලද මුදලින් කොටසක් දරන ලද්දේ ස්වීඩන් රජය විසිනි. ස්වීඩන් රජය අවශ්‍යයෙන්ම මෙම වාර්තා වේ අදහස් අනුමත කිරීමක් නොකරනු ලබන අතර , ආර්ටිකල් 19 එහි සම්පූර්ණ වගකීම දරනු ඇත .

This document is dual language: English - Sinhala. It is available in Bahasa, Burmese, Chinese, Khmer, Sinhala and Vietnamese.

# The Public's Right to Know: Principles on Right to Information Legislation

These Principles were originally developed in 1999 and updated in 2015. They have been endorsed by Abid Hussain, the UN Special Rapporteur on Freedom of Opinion and Expression, in his report to the 2000 Session of the United Nations Commission on Human Rights (E/CN.4/2000/63), and referred to by the Commission in its 2000 Resolution on freedom of expression, as well as by Hussain's successor Frank LaRue in 2013 in his report to the UN General Assembly in 2013 (A/68/362, 4 September 2013).


Principle 1: Maximum disclosure 2

Principle 2: Obligation to publish 4

Principle 3: Promotion of open government 6

Principle 4: Limited scope of exceptions 10

Principle 5: Processes to facilitate access 12

Principle 6: Costs 16

Principle 7: Open meetings 18

Principle 8: Disclosure takes precedence 20

Principle 9: Protection for whistleblowers 20

About ARTICLE 19 24


# මහජනයාගේ දැනගැනීමේ අයිතිය : තොරතුරු දැනගැනීමේ අයිතිය හා සබැඳි නීති සම්පාදනයට අදාල මූලධර්ම

1999 දී සකස්කරන ලද මෙම මූලධර්ම 2015 දී යාවත්කාලීන කරන ලදී. මෙම මූලධර්ම 2000 වසරේ එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් සැසිවාරයට (E/CN.4/2000/63) ඉදිරිපත් කරන ලද සිය වාර්තාව මගින් සහ 2000 වසරේ කොමිසමේ යෝජනාවට යොමු කිරීම මගින්, එක්සත් ජාතීන් ගේ මත දැරීමේ හා භාෂණයේ නිදහස පිලිබඳ විශේෂ නියෝජිත අබිද් හුසේන් විසින් අනුමත කරනු ලැබ අත . එමෙන්ම ඔහුගේ අනුප්‍රාප්තික ප්‍රැන්ක් ලාරූ විසින් 2013 එක්සත් ජාතීන් ගේ වාර්ෂික ස්මුළුවට ඉදිරිපත් කරන ලද සිය වාර්තාවට ඇතුලත් කිරීමෙන් ද අනුමත කර තිබේ (a/68/362, 4 September 2013).


මූලධර්ම 1 – උපරිම අනාවරණය 3

දෙවන මූලධර්මය – ප්‍රකාශනයට බැඳී සිටීම 5

තුන්වන මූලධර්මය – විවෘත ආණ්ඩුකරණයට අනුබලදීම 7

හතරවැනි මූලධර්මය – සීමිත ව්‍යතිරේකයන් 9

පස්වැනි මූලධර්මය – පහසුවනේ ලඟාවීම සඳහා ක්‍රියාකිරීම 13

සයවැනි මූලධර්මය – පිරිවැය 17

සත්වැනි මූලධර්මය – විවෘත සාකච්ඡා 19

අටවැනි මූලධර්මය – වඩා වැදගත් වන්නේ හෙලිදරව් කිරීමය 21

නවවැනි මූලධර්මය – නළාපිඹින්නන් ආරක්ෂා කිරීම 21

ආර්ටිකල් 19 පිළිබඳව 25

# Principle 1: Maximum disclosure

**Right to information legislation should be guided by the principle of maximum disclosure**

The principle of maximum disclosure establishes a presumption that all information held by public bodies should be subject to disclosure and that this presumption may be overcome only in very limited circumstances (see Principle 4). This principle encapsulates the basic rationale underlying the very concept of the right to information in international law and ideally should be provided for in the Constitution to make it clear that access to official information is a basic right. The overriding goal of legislation should be to implement maximum disclosure in practice.

Public bodies have an obligation to disclose information and every member of the public has a corresponding right to receive information. The right should be available to all persons and informal and formal organisations, regardless of citizenship or residence. The exercise of this right should not require individuals to demonstrate a specific interest in the information or to explain why they wish to obtain it. Where a public authority seeks to deny access to information, it should bear the onus of justifying the refusal at each stage of the proceedings. In other words, the public authority must show that the information which it wishes to withhold comes within the scope of the limited regime of exceptions, as detailed below.

## Definitions

Both 'information' and 'public bodies' should be defined broadly.

'Information' includes all materials held by a public body, regardless of the form in which the information is stored (document, computer file or database, audio or video tape, electronic recording and so on), its source (whether it was produced by the public body or some other entity or person) and the date of production. The legislation should also apply to information which has been classified as secret or some other designation, subjecting them to the same test as all other information. In some jurisdictions, this extends to samples of physical materials used by public bodies in public works  The law should also include, the obligation to disclose should apply to records themselves and not just the information they contain, as the context in which it is held is information also.

For purposes of disclosure of information, the definition of 'public body' should include all branches and levels of government including local government,

# මූලධර්ම 1 – උපරිම අනාවරණය

තොරතුරු දැනගැනීමේ නීතියක් උපරිම අනාවරණය පිළිබඳ මූලධර්මයෙන් මෙහෙයවිය යුත්තේය

උපරිම අනාවරණය පිළිබඳ වූ මූලධර්මය ස්ථාපිතවී ඇත්තේ මහජන ආයතන සතු සියලුම තොරතුරු හෙළිදරව් කරනු ලැබීමට යටත්වන්නේය යන පිළිගැනීම මතවන අතර එසේ නොවන්නේ ඉතාම සීමා සහිත තත්ත්වයන් යටතේ ය . ( බලන්න මූලධර්ම 4 ) . නිල තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව මූලික අයිතියක් ය යන්න ව්‍යවස්ථාව මගින් නිරවුල් කිරීම ප්‍රශස්තය යන තොරතුරු දැන ගනීම සඳහා වන ජාත්‍යන්තර නීතියේ සංකල්පය, මෙම මූලධර්මයේ ඉතාම වැදගත් පදනම වන්නේ ය .

තොරතුරු අනාවරණය කිරීම මහජන ආයතනයන් හි වගකීමක් වන අතර සෑම පුද්ගලයකුටම එම තොරතුරු වෙත ලගාවීමේ, පරිශීලනය කිරීමේ සම අයිතියක් ඇත්තේය . පුරවැසිභාවය හෝ නේවාසික තත්ත්වයන් නොසලකා සෑම පුද්ගලයකුටම සහ විධිමත් හා අවිධිමත් සංවිධානයන්ට එම අයිතිය තිබිය යුත්තේ ය . මෙම අයිතිය ක්‍රියාවේ යෙදවීමේදී පුද්ගලයකුට , තොරතුරු ලබා ගන්නේ ඇයිද යන්න පැහැදිලි කිරීමට හෝ එම තොරතුරු පිළිබඳ විශේෂ ලැදියාවක් පෙන්නුම් කිරීමක් අවශ්‍ය නොවිය යුත්තේය . මහජන අධිකාරියක් විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී, එම ක්‍රියාවලියේ සෑම අදියරකදීම, එකී ප්‍රතික්ෂේප කරනු ලැබීම සාධාරණීය කරනු ලැබීමේ වගකීමකට බැඳී සිටින්නේය . වෙනත් ආකාරයකට කියන්නේනම්, මෙහි පහත විස්තරාත්මකව සඳහන් කර ඇති පරිදි, එම තොරතුරු ලබා නොදීම, නීතිමය ව්‍යතිරේකයන්ට යටත්බව මහජන අධිකාරිය විසින් පෙන්නුම් කළයුත්තේය .

## අර්ථනිරූපන

"තොරතුරු" හා "මහජන ආයතන " යන දෙකම හොඳින් අර්ථනිරූපනය කළයුත්තේය .

මහජන ආයතනයක් සතු සියලුම කරුණු – ගබඩා කරනු ලැබ ඇති ක්‍රමවේදය කුමක් වුවත් ( ලියවිලි, පරිගණක ලිපිගොනු හෝ දත්ත ගබඩා, ශ්‍රව්‍ය /දෘශ්‍ය තැටි, ඉලෙක්ට්‍රෝනික පටිගත කිරීම ආදී) , එහි මූලාශ්‍රය ( මහජන ආයතනයක්, වෙනත් ආයතනයක් හෝ පුද්ගලයකු විසින් එය නිපදවනු ලැබුවේද යන්න ) සහ එය නිපදවනු ලැබූ දිනය – “තොරතුරු" යන්නට ඇතුලත්වේ. "රහස්‍ය" ලෙස හෝ වෙනත් නාමයන් යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇති තොරතුරුද, නීතිය විසින් අනෙක් තොරතුරු හා සමානවම සැලකිය යුත්තේය . සමහර බලාධිකාරයන්හිදී මෙය , මහජන ආයතන විසින්, මහජන කටයුතු සඳහා යොදාගනු ලැබූ භෞතික තොරතුරු සාම්පලයන් සඳහා ද යෙදේ. තොරතුරු ගබඩා කර ඇති සන්ධර්භය අනුව , තොරතුරු පමනක් නොව ඒවායේ වාර්තා ද අනාවරණය කිරීමේ වගකීමට යටත්වනසේ නීතිය සකස් කල යුතුය .

තොරතුරු හෙළිදරවු කිරීමේ අවශ්‍යතාවය මත , "මහජන ආයතන " යන්නට ; අධිකරණ ආයතන , දෙපාර්තමේන්තු නොවන ආණ්ඩුව විසින් පිහිටුවන ලද ස්වාධීන ආයතන , සංස්ථා, ජනසතු කරන ලද කර්මාන්ත , ව්‍යවස්ථාපිත ආයතන , ජාතික පාර්ලිමේන්තුවද අතුලුව සියලුම නියෝජිතායතන ඇතුළු සියලුම රජයේ ආයතනද සහ මහජන කටයුතු ඉටුකරනු ලබන පුද්ගලික ආයතන ( මහා මාර්ග නඩත්තු කරනුලබන හා දුම් රිය නඩත්තු කරනු ලබන ආයතන වැනි) හෝ තීරණ ගැනීමේ අයිතිය ඇති ආයතන හා රජයේ මුදල් වැයකරන ආයතන ආදිය ඇතුලත්වේ. ආරක්ෂාවභාර ආයතනද ඇතුළුව, කිසිම ආයතනයක් මෙයින් නිදහස් නොවේ. පරිසරය , සෞඛ්‍ය හා මානව හිමිකම් ආදී විෂය යන්ට අදාල තොරතුරු සන්තකයේ තබාගන්නා සහ එම තොරතුරු හෙළිදරවු කිරීමෙන් මහජන අවාදානම් අවම කළ හැක්කේ නම්, එවැනි තොරතුරු ඇති පුද්ගලික ආයතනයන් ද මෙයට ඇතුලත් ය . රාජ්‍යයන් අතර කටයුතු කරන සංවිධානද මෙම ලියවිල්ලෙන් පෙන්නුම් කරනු ලබන තොරතුරු දැනගනීමේ මූලධර්මයන් පිළිබඳ වපසරියට ඇතුලත් වේ.

## තොරතුරු ගබඩා කිරීම සහ විනාශ කිරීම

තොරතුරු ලබාදීමට ඇති සූදානම සහ එම ක්‍රියාවලියේ සුපිළිපන්නභාවය ආරක්ෂා කර ගැනීම සඳහා මහජන ආයතනයන්හි ඇති තොරතුරු විනාශ නොවීමටත් ඒවා පවත්වාගෙන යාමටත් අවශ්‍ය අවම ප්‍රමිතීන් නීතිය මගින් ස්ථාපිත කළ යුත්තේය . මහජන ලේඛණාරක්ෂණය සතුටුදායක ලෙස පවත්වාගැනීම සඳහා අවශ්‍ය සම්පත් හා අවධානය එම ආයතන වෙත ලබාදිය යුත්තේය . තොරතුරු වෙත ප්‍රවේශ වීම වළකාලීම හෝ ඒවා විනාශ කිරීම අපරාධ ඝණයේ වරදක් බවට පත්කළ යුතුය .

elected bodies (including national parliaments), bodies which operate under a statutory mandate, nationalised industries and public corporations, non-departmental bodies or quangos (quasi non-governmental organisations), judicial bodies, and private bodies which carry out public functions (such as maintaining roads or operating rail lines) or hold decision-making authority or expend public money. No bodies, including defence and security bodies, should be exempt. Private bodies themselves should also be included if they hold information whose disclosure is likely to diminish the risk of harm to key public interests, such as the environment and health or affect individuals' human rights. Inter-governmental organisations should also be subject to right to information regimes based on the principles set down in this document.

## Retention and Destruction of Information

To protect the integrity and availability of information, the law should establish minimum standards regarding the maintenance and preservation of information by public bodies. Such bodies should be required to allocate sufficient resources and attention to ensuring that public record-keeping is adequate. It should provide that obstruction of access to, or the willful destruction of information is a criminal offence. ]

# Principle 2: Obligation to publish

**Public bodies should be under an obligation to publish key information**

The right to information implies not only that public bodies respond to requests for information but also that they proactively publish and disseminate widely information of significant public interest, subject only to reasonable limits based on resources and capacity. Which information should be published will depend on the public body concerned. The law should establish both a general obligation to publish and key categories of information that must be published.

Public bodies should, as a minimum, be under an obligation to routinely publish and update the following categories of information:

- operational information about how the public body functions, including objectives, organizational structures, standards, achievements, manuals, policies, procedures, rules, and key personnel;
- information on audited accounts, licenses, budgets, revenue, spending, subsidy programmes public procurement, and contracts;

# දෙවන මූලධර්මය – ප්‍රකාශනයට බැඳී සිටීම

වැදගත් තොරතුරු ප්‍රසිද්ධ කිරීමට මහජන ආයතන බැඳී සිටිය යුත්තේය

තොරතුරු සඳහා ඇති අයිතිය යන්නෙන් ඇඟවෙන්නේ අයදුම්කළ විට තොරතුරු ලබා දීම පමණක් නොවේ. සම්පත් සීමාසහිතභාවයට පමණක් යටත්ව , සැළකිය යුතු මහජන වැදගත්කමක් ඇති තොරතුරු ස්වෙච්ඡාවෙන්ම ප්‍රකාශයට පත් කිරීමත් ඒවා පුළුල් ලෙස බෙදා හැරීමත් එයට ඇතුලත්වේ. කුමන තොරතුරු ප්‍රකාශනයට පත් කළ යුතුද යන්න තීරණය වන්නේ ආයතනයේ ස්වභාවය මතය . තොරතුරු ප්‍රකාශයට පත් කළ යුතු බවටත්, ප්‍රකාශයට පත් කළයුත්තේ කුමන ප්‍රධාන තොරතුරුද යන්නටත් අදාලව නීති පැනවිය යුතුය .

මහජන ආයතන විසින් අවම වශයෙන් පහත දැක්වෙන තොරතුරු සිරිතක් ලෙස ප්‍රකාශනයට පත්කළ යුත්තේය, යාවත්කාලීන කළයුත්තේය .

- ආයතනයේ පරමාර්ථ, ව්‍යුහය , ප්‍රමිතීන්, ලබා ඇති ප්‍රතිඵල , අත් පොත්, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, රීති හා ආයතනයේ ප්‍රධාන නිලධාරීන් ද ඇතුළුව ආයතනයේ ක්‍රියා කාරකම් පිළිබඳ තොරතුරු;
- විගණනය කරනලද ගිණුම්, බලපත්‍ර , අයවැය , ආදායම , වියදම , අධාර වැඩ සටහන්, මිලදී ගැනීම් හා ගිවිසුම් පිළිබඳ තොරතුරු;
- මහජන ආයතනයට අදාලව සිදුකරෙන සෘජු මහජන ක්‍රියාකාරකම් හෝ අයදුම් හා පැමිණිලි පිළිබඳ තොරතුරු;
- ප්‍රධාන ප්‍රතිපත්තිමය හෝ නීති කෙටුම්පත් සම්බන්ධව මහජනයාට මැදිහත්විය හැකි ආකාරය පිළිබඳ මගපෙන්වීම්;
- ලේඛණ රෙජිස්ට්‍රියද ඇතුලත්ව , ආයතනය සතුවන්නේ කුමන තොරතුරුද හා ඒවා ගබඩා කර ඇත්තේ කුමන ආකාරයෙන් ද; සහ
- මහජනයා කෙරෙහි බලපෑමක් ඇතිවන්නාවූ තීරණ හෝ ප්‍රතිපත්ති පිලිබඳව – පරිසරයට , සමාජයට හා මානව හිමිකම්වලට ඇතිවන්නාවූ බලපෑම පිළිබඳ ඇගයීම ද ඇතුළුව – එවැනි තීරණයකට එළැඹුනේ ඇයිද යන්නත් එම තීරණය ගැනීමේ සන්දර්භයට අදාල ලිපිලේඛණත්

## විවෘත දත්ත සහ නැවත භාවිතාව

තොරතුරු විවෘතව හා අදාලවන අවස්ථාවන්හී දී යන්ත්‍රානුසාරයෙන් කියවීමට හැකිවන ලෙසත්, කිසිම බාධාවකින් තොරව ඒවා නැවත භාවිතා කිරීමට හැකිවන ආකාරයෙනුත් අයදුම් කිරීමකට ප්‍රතිචාර ලෙස මෙන්ම ස්වෙච්ඡාවෙන්මත් ප්‍රකාශනයට පත්කළ යුත්තේය .

# තුන්වන මූලධර්මය – විවෘත ආණ්ඩුකරණයට අනුබලදීම

මහජන ආයතන ක්‍රියාකාරී ලෙස විවෘත ආණ්ඩුකරණයට අනුබලදිය යුත්තේය

තොරතුරු ලබාගැනීමේ නිදහස පිලිබඳ නීතියේ අරමුණු ඉටු කරගැනීම සඳහා මහජන අයිතීන් පිලිබඳ ඔවුන් දැනුවත් කිරීමත් රාජ්‍ය විසින්ම විවෘතභාවය පිළිබඳ සංස්කෘතියකට අනුබලදීමත් අත්‍යාවශ්‍ය වේ. විවිධ රටවල අත්දැකීම් මගින් පෙන්නුම් කරනුයේ නීතියට ගරු නොකරන නිලධාරී පැලැන්ති විසින් ඉතාමත් ඉදිරිගාමී නීති බලරහිත බවට පත්කර ඇති බවය . එබැවින් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිලිබඳ නීති බලාත්මක කරගැනීම සඳහා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් අත්‍යාවශ්‍ය අංගයක් වේ.

- information on any requests, complaints or other direct actions which members of the public may take in relation to the public body;
- guidance on processes by which members of the public may provide input into major policy or legislative proposals;
- the types of information which the body holds and the form in which this information is held, including any registers of documents and databases; and
- the content of any decision or policy affecting the public, along with reasons for the decision and background material of importance in framing the decision, including all environmental, social, or human rights impact assessments.

### Open data and reuse

Information proactively published, as well as that released in response to requests, should be made available in open and machine readable formats when applicable, and without restrictions on its further use and publication.

# Principle 3: Promotion of open government

**Public bodies must actively promote open government**

Informing the public of their rights and promoting a culture of openness within government are essential if the goals of right to information legislation are to be realised. Indeed, experience in various countries shows that a recalcitrant civil service can undermine even the most progressive legislation. Promotional activities are, therefore, an essential component of a right to information regime. This is an area where the particular activities will vary from country to country, depending on factors such as the way the civil service is organised, key constraints to the free disclosure of information, literacy levels and the degree of awareness of the general public. The law should require that adequate resources and attention are devoted to the question of promoting the goals of the legislation.

### Public Education

As a minimum, the law should make provision for public education and the dissemination of information regarding the right to access information, the scope of information which is available and the manner in which such rights may be exercised. In countries where newspaper distribution or literacy levels

සාමන්‍ය ජනතවගේ අවබෝධයේ ප්‍රමාණය , සාක්ෂරතාවය , නිදහස් තොරතුරු නිරාවරණයකට ඇති ප්‍රධාන සීමාවන්, නිලධාරී තන්ත්‍රය සංවිධානගතවී ඇති ආකාරයේ ස්වභාවය සමාන නොවීම වැනි හේතුමත මෙවැනි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් රටින් රටට සුවිශේෂ වන්නේය . නීතියේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා එවැනි ප්‍රවර්ධන ක්‍රියාවලියකට අවශ්‍ය අවධානය සහ සම්පත් නීතිය මගින්ම නියම කිරීම යහපත්වේ.

## මහජන අධ්‍යාපනය

අවමවශයෙන් වත්, අයිතීන් භාවිතා කළහැකි ආකාරයද ඇතුළත්ව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කරුණු බෙදාහැරීමටත් මහජන අධ්‍යාපනය සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදන නීතිය මගින් ඇතිකළ යුතුය . සාක්ෂරතාවයෙන් දුබල , පුවත්පත් බෙදාහැරීම අඩු මට්ටමක ඇති රටවල එවැනි අධ්‍යාපන වැඩ සටහන් සඳහා හොඳම මාර්ගය වන්නේ ගුවන් විදුලි මාධ්‍යයය . ප්‍රාදේශීය තොරතුරු මධ්‍යස්ථාන හා වෙනත් පුරවැසි සංවිධාන මත පදනම්වූ තොරතුරු පද්ධතීන්ද මේ සඳහා යොදාගත හැක . තැනින් තැන පෙන්වියහැකි වාර්ථා චිත්‍රපට , සාකච්ඡා වැනි නිර්මාණාත්මක විකල්ප පිළිබඳවත් සොයා බැලිය හැක . මෙවැනි වැඩසටහන් තොරතුරු ලබාගැනීම පිළිබඳවූ අයදුම්පත් සළකාබලන තනි තනි මහජන ආයතනවලටම හෝ ප්‍රවර්ධන කටයුත්ත වෙනුවෙන්ම පිහිටුවනු ලබන ආයතනයක් වෙතද භාරදිය හැක .

## රාජ්‍ය රහස් පිළිබඳවවූ සංස්කෘතිය සමග ගනුදෙනු කිරීම

ආණ්ඩුවක් තුළ ඇති රහස්‍යභාවය පිළිබඳවවූ සංස්කෘතිය සමග ගනුදෙනු කිරීම ගැටළුවට පිලියම් ලෙස නීතිය මගින් යාන්ත්‍රණ ගණනාවක් ඇතිකළ හැකිය . තොරතුරුවලට ඇති අයිතිය පිළිබඳව සියලුදේ ඇතුලත් සම්පූර්ණ පුහුණුවක් සිය සේවාදායකයින් වෙත ලබාදීමේ අවශ්‍යතාවය එයට ඇතුලත් කළ හැක . තොරතුරු කෙරෙහි ඇති අයිතියේ වැදගත්කම , එයට අදාල සියලු විෂයයන්, තොරතුරු ලබාදීමේ යාන්ත්‍රණ පිලිබඳ ක්‍රියා පටිපාටීන්, කාර්යක්ෂම ලෙස තොරතුරු නඩත්තු කරන්නේ හා ඒවාට පිවිසෙන්නේ කෙසේද වැනි කරුණු, රහසිගතව තොරතුරු හෙළිකරන්නන්ට අදාල සියලු කරුණු, තම ආයතනය කුමන ආකාරයේ තොරතුරු ලබාදීමට බැඳී සිටින්නේද වැනි කරුණු එවැනි පුහුණුවක් මගින් ආමන්ත්‍රණය කළ හැක . තමතමන් ගේ භූමිකාවට අනුරූපනවන අයුරින් සියලුම නිලධාරීන් වෙත කිසියම් ආකාරයක පුහුණුවක් ලබදිය යුතුය .

මහජනයාගේ අධ්‍යාපනය භාර රජයේ නිල ආයතනයටද විවෘත ආණ්ඩුකරණය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය වෙනුවෙනේ භූමිකාවක් හිමිය . ඉතා හොඳින් කටයුතු කරන , රහස්‍යභාවය පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය වෙනුවෙනේ වැඩ සටහන් දියත්කරන , සන්නිවේදන වැඩ සටහන් දියත් කරන ආයතන වෙත ප්‍රතිදාන පිරිනැමීමේත්, වඩා වැඩියෙන් රහස්‍ය සංස්කෘති පවත්වාගෙන යනු ලබන ආයතන විවේචනය කිරීමේත් ප්‍රතිපත්තියක් ඇතිකළ යුතුය. ලබාගන්නා ලද ප්‍රතිඵල මෙන්ම මුහුණ දෙන ගැටළුන්ද ඇතුලුව , මහජනයාට තොරතුරු වෙත පිවිසීමේ හැකියාව වැඩි දියුණු කිරීම වෙනුවෙන් ගන්නාලද ක්‍රියාමාර්ග , තොරතුරු නිදහසේ ගලායාමට ඇති හඳුනාගන්නා ලද පවත්නා සීමාවන් තිබේනම් ඒවාද , ඉදිරි වසරේ ක්‍රියාමාර්ගද ඇතුලත් වාර්ෂික වාර්තාවක් සියලුම මහජන ආයතන විසින් පාර්ලිමේන්තුවට හා/හෝ පාර්ලිමේන්තු ආයතන වෙත ලබාදිය යුතුය .

# හතරවැනි මූලධර්මය – සීමිත ව්‍යතිරේබයන්

ව්‍යතිරේබයන් “හානිය " සහ "මහජන ලැදියාව " පිළිබඳ පරීක්ෂණයට තදබල ලෙස යටත්ව පහැදිලිවත් සියුම් ලෙසත් අර්ථකතනය යුත්තේය

ව්‍යතිරේබයන් පිළිබඳ සීමාවන්ට යටත්වන බව පෙන්නුම් කිරීමේ හැකියාවක් ඇත්තේනම් මිස තොරතුරු සඳහාවන සෑම මහජන ඉල්ලීමක්ම ඉටුකළ යුත්තේය . තදින්ම නියම කරනලද කොටස් තුනකින් යුතු පරීක්ෂණය සමත්වනබව පෙන්නුම් කිරීමට මහජන ආයතනය සමත්වන්නේනම් මිස තොරතුරු අයැදුම් ප්‍රතික්ෂප කිරීමක් සාධාරණීයකරණය නොකළ හැක්කේය . ආයතනයකට විශේෂිත වූ තොරතුරක් නිකුත් කිරීමෙන් වැළකිසිටිය හැකිවන එකම අවස්ථාව වන්නේ ලියකියවිලිවළින් හෝ වාර්තාවලින් බැහැරකරන ලද තොරතුරු තිබේනම් පමණක් වන අතර එවන් අවස්ථාවන්හිදී සංස්කරණය කරනලද වාර්තාවක් ලබාදිය යුතුය .

are low, the broadcast media are a particularly important vehicle for such dissemination and education. Information and communications technologies can also be effective. Local public information boards and other community-based information systems should also be used. Creative alternatives, such as town meetings or mobile film units, should also be explored. Such activities should be undertaken both by individual public bodies and a specially designated and adequately funded official body – either the one which reviews requests for information, or another body established specifically for this purpose.

### Tackling the culture of official secrecy

The law should provide for a number of mechanisms to address the problem of a culture of secrecy within government. These should include a requirement that public bodies provide comprehensive right to information training for their employees. Such training should address the importance and scope of right to information, procedural mechanisms for accessing information, how to maintain and access records efficiently, the scope of whistleblower protection, and what sort of information a body is required to publish. Officials at all levels should receive some training, depending on their role.

The official body responsible for public education should also play a role in promoting openness within government. Initiatives might include incentives for public bodies that perform well, campaigns to address secrecy problems and communications campaigns encouraging bodies that are improving and criticising those which remain excessively secret. Bodies should provide annual reports to Parliament and/or Parliamentary bodies on their activities, highlighting problems and achievements, which might also include measures taken to improve public access to information, any remaining constraints to the free flow of information which have been identified, and measures to be taken in the year ahead.

## Principle 4: Limited scope of exceptions

**Exceptions should be clearly and narrowly drawn and subject to strict “harm” and “public interest” tests**

All individual requests for information from public bodies should be met unless the public body can show that the information falls within the scope of the limited regime of exceptions. A refusal to disclose information is not justified unless the public authority can show that the information meets a strict three-

## කොටස් තුනේ පරීක්ෂාව

- ජාත්‍යන්තර නීතියට අනුකූල යුක්තිසහගත අරමුණකට අදාල තොරතුරක්;
- හෙළිදරව් කිරීමෙන් එම අරමුණට සැලකිය යුතු හානියක් සිදුවන්නේනම්; හා
- එම හානිය මහජන ළැදියාවට වඩා විශාල වන්නේනම්.

කිසියම් මහජන ආයතනයක කටයුතු වලින් විශාලම කොටසක් මේ ව්‍යතිරේඛ ගණයට අයත්වුවත්, කිසිම මහජන ආයතනයක් නීතියේ බලාධිකාරයට යටත්වීමෙන් නිදහස් නොකළ යුතුය . මෙය , විධායක , ව්‍යවස්ථාදායක හා අධිකරණ ඇතුලු සෑම රජයේ අංශයකටම මෙන්ම රාජ්‍ය ආරක්ෂක ආයතන හා ඒවායේ ක්‍රියාකාරකම් ද ඇතුළු ආණ්ඩුවක සෑම ක්‍රියාකාරකමටම අදාලවේ. සීමාකිරීමේ අරමුණ, ආණ්ඩුව අපහසුතාවයට පත්වීමෙන් ආරක්ෂා කරගැනීම හෝ දූෂණ හා මානව හිමිකම් කඩකිරීම් හෙළිදරව් වීම වළකාලීම වේ නම් එවැන්නක් සාධාරණීය කළ නොහැක්කේය .

## ව්‍යතිරේඛයන් සාධාරණය කළහැකි යුක්තිසහගත අරමුණු

තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු අඩංගු සම්පූර්ණ ලැයිස්තුවක් නීතිය මගින් ස්ථාපිත කළ යුත්තේය . එවැනි ලයිස්තුවකට ඇතුලත් කළ යුත්තේ යුක්තිසහගත පදනමක් වශයෙන් සලකනු ලබන්නාවූ දෙ පමණක් වන අතර එය, නීතිය බලගැන්වීම, ජාතික ආරක්ෂාව , පුද්ගලිකත්වය , වාණිජ හෝ අනකෙුත් රහස්‍යභාවයන්, මහජන හෝ පුද්ගලික ආරක්ෂාව , ආණ්ඩුවේ සුපිළිපන්න හා කාර්යක්ෂම තිරණ ගැනීමේ ක්‍රියාවලි වැනි ජාත්‍යන්තර නීතිය අනුව පිළිගෙන ඇති කරුණු වලට පමණක් සීමා කළ යුතුය .

තොරතුරු හෙළිදරවු කිරීම සීමා කිරීම වැළැක්වීම සඳහාත් යුක්තිසහගත අරමුණුවලට හානියක් නොවීමටත් ව්‍යතිරේඛයන් සියුම් ලෙස අර්ථකතනය කිරීම යහපත් වේ. ව්‍යතිරේඛ පදනම් වියයුත්තේ තොරතුරුවල අන්තරගතය මත මිස වර්ගීකරණය හෝ ස්වභාවය මත නොවේ. නිදහස් නොකළ තොරතුරු නිතර සුපරීක්ෂණය කළ යුත්තේ එවැනි නිදහස් කිරීමක වලංගුභාවය තවමත් තිබේ දැයි පරීක්ෂා කිරීමටය . නිදසුනක් ලෙස ජාතික ආරක්ෂාවේ නාමයෙන් වර්ගීකරණය කිරීම් එම විශේෂ ජාතික ආරක්ෂාව පිළිබඳ තර්ජනය පහව ගිය පසු තවදුරටත් වලංගු නොවේ. අති විශේෂ තත්ත්වයන් යටතේ හැර ව්‍යතිරේඛයන් ගේ සීමාව වසර 15කට වඩා වැඩි නොකළ යුතුය .

## ප්‍රතික්ෂප කිරීමක් සැළකිය යුතු හානිය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් විය යුතුය

තොරතුරු හුදකේ, නීතියේ සඳහන් තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු අඩංගු ලැයිස්තුවට ඇතුලත් වීම පමණක් ප්‍රමාණවත් නොවේ. තොරතුරු හෙළිදරව් කිරීමෙන්, 'තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු' වලට සැළකිය යුතු හානියක් සිදුවන බවද මහජන ආයතනය විසින් පෙන්නුම් කළ යුතුය . නිදසුනක් ලෙස , ආරක්ෂක හමුදාවන්ට අදාල දූෂණ හෙළිදරව් කිරීමක් බැලු බැල්මට ජාතික ආරක්ෂාව දුර්වල කරන්නක් ලෙස පෙනුනද කාලයාගේ ඇවෑමෙන් එය දූෂණ තුරන් කිරීමටත් ආරක්ෂක හමුදා ශක්තිමත් කිරීමටත් හේතුවේ. එවැනි තත්ත්වයකදී තොරතුරු හෙළිදරව් කිරීමෙන් වැළකී සිටීමක් යුක්තිසහගත කළ හැක්කේ, තොරතුරු හෙළිදරව් කිරීමේ අවසාන ප්‍රතිඵලයේ බලපෑම මගින් 'තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු' වලට සැළකිය යුතු හානියක් සිදුවන්නේනම් පමණි.

## වඩා වැදගත්වන්නේ මහජන යහපතය

'තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු' වලට සැළකිය යුතු හානියක් සිදුවන බව පෙන්විය හැකි වුවත් හෙළිදරව් කීමෙන් ඇතිවන වන ප්‍රතිලාභය හානියට වඩා වැඩි වන්නේනම් එවිට තොරතුරු අනාවරණය කිරීම කළයුත්තේය . නිදසුනක් ලෙස යම් නිශ්චිත තොරතුරක් එහි ස්වභාවය අනුව පුද්ගලික ඝණයට ඇතුලත් විය හැකිවුවත් ඒ සමගම එය ආණ්ඩුවේ ඉහලමට්ටමේ දූෂණයකට අදාලවිය හැක . 'තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු' වලට වන හානිය මහජන යහපත සමග

part test.

Bodies should only withhold the specific information that is exempted in documents or records and provide redacted versions of the remainder of the material.

## The three-part test

- the information must relate to a legitimate aim as provided for in international law;
- disclosure must threaten to cause substantial harm to that aim; and
- the harm to the aim must be greater than the public interest in having the information.

No public bodies should be completely excluded from the ambit of the law, even if the majority of their functions fall within the zone of exceptions. This applies to all branches of government (that is, the executive, legislative and judicial branches) as well as to all functions of government (including, for example, functions of security and defence bodies). Non-disclosure of information must be justified on a case-by-case basis.

Restrictions whose aim is to protect governments from embarrassment or the exposure of wrongdoing including human rights violations and corruption can never be justified.

## Legitimate aims justifying exceptions

A complete list of the legitimate aims which may justify non-disclosure should be provided in the law. This list should include only interests which constitute legitimate grounds for refusing to disclose documents and should be limited to matters recognized under international law such as law enforcement, privacy, national security, commercial and other confidentiality, public or individual safety, and the effectiveness and integrity of government decision-making processes.

Exceptions should be narrowly drawn so as to avoid limiting the disclosure which does not harm the legitimate interest. They should be based on the content, rather than the type, of the information. Information that is withheld should be routinely reviewed to ensure that the exemption still applies. For example, the justification for classifying information on the basis of national security may well disappear after a specific national security threat subsides. Exceptions should be limited to no more than 15 years, except in extraordinary circumstances.

සැසඳිය යුතුය . මහජන යහපත, 'තොරතුරු සීමා කළහැකි යුක්තිසහගත අරමුණු' වලට වන හානියට වඩා වැඩි වන්නේනම් නීතිය මගින් තොරතුරු හෙළිදරව් කිරීමට ඉඩ දිය යුත්තේය . මහජන යහපතට ඇතුලත් කළයුතු අනෙකුත් කරුණු වන්නේ, තවමත් විවාදයට භාජනයවී ඇති මහජනයාට වැදගත් වන එකතු කිරීම්, දේශපාලන විවාදයට ඇති මහජන සහභාගිත්වය වැඩිදියුණු කිරීම්, විශේෂයෙන් මහජන අරමුදල් භාවිතාව හා මහජන කටයුතුවලදී වගවීම වැඩි දියුණු කිරීම; බරපතල අකටයුතුකම්; මානව හිමිකම් කඩකිරීම්ද ඇතුලත්ව, බලය අයුතු ලෙස භාවිතා කිරීම්, දැනුවත්ව බරපතල අකටයුතුකම් සැඟවීම්; හා මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව කෙරෙහි ඇති ප්‍රයෝජනය ය .

## පස්වැනි මූලධර්මය – පහසුවෙන් ලඟාවීම සඳහා ක්‍රියාකිරීම

තොරතුරු අයදුම් ඉටුකිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය කඩිනම් හා සාධාරණ වියයුතු අතර ප්‍රතික්ෂප කිරීම් සඳහා ස්වාධීන විමර්ශන වාර්තා ඉදිරිපත්කල යුතුය

තොරතුරු සඳහා වන මහජන අයදුම් හා ඒවා ලබාදීම සහතික කරන පහසු සහ විවෘත අභ්‍යන්තර ක්‍රියා පටිපාටියක් සෑම මහජන ආයතනයක් විසින්ම ස්ථාපිත කිරීම අවශ්‍යවේ. ආයතන විසින් එවැනි ඉල්ලීම්, නීතියට අනුකූලව ඉටුකිරීම සඳහා වගකිය යුතු පුද්ගලයකු පත්කළ යුතුය .

ප්‍රකාශයට පත්කරන ලද හෝ අපැහැදිලි, ඉතාමත්ම පුලුල් හෝ එසේමෙත් නැත්නම් නැවත සංවර්ධනය කළයුතු තොරතුරු අයැදුම් කරන්නන්ට සහයවීම මහජන ආයතනයක යුතුකමකි. එමෙන්ම, පැහැදිලි ලෙසම ආයතනයේ කටයුතු වලට බාධා කිරීමේ අරමුණ සඳහා පමණක්ම වන වැදගැම්මකට නැති හා පීඩාවට පත්කිරීම සඳහා පමණක්ම වන වන ඉල්ලීම් ප්‍රතික්ෂප කිරීමේ හැකියාවක් මහජන ආයතනයට තිබිය යුතුය .

අයදුමක් සඳහා පිළිතුරුදීම මාසයක් තුල ඉටු කරන ලෙස නීති මගින් තදබල ලෙස සීමා පැණවීම යහපත් ය .

කුමන හෝ ප්‍රතික්ෂප කිරීමක්, නීතිය මගින් නියම කරන ලද ව්‍යතිරේකමත පදනම් වූ සත්‍ය හේතු සහිත ලිඛිත කරුණු දැක්වීමක් සමඟ නැවත විනිශ්චයක් සඳහා අයදුම් කිරීමට ඇති අයිතිය පිළිබඳ තොරතුරුද අයදුම්කරුට ලබා දිය යුතු බවට නීතිය මගින් ඉල්ලා සිටිය යුතුය .

### අභියායචනා

තොරතුරු සම්බන්ධයෙන් වන අයැදුම් සඳහා වන ක්‍රියා පටිපාටියේ මහජන ආයතනය තුල , ස්වාධීන අධිකාරියකට කරනු ලබන අභියායචනා, හා අධිකරණය වෙත අභියායචනා වශයෙන් තල තුනක් තිබෙනෙබව පැහැදිලි කළ යුතුය .

